LESSON 02

# Am, Is, Are

ඈම්, ඉස්, ආ

මෙම පාඩම බෙහෙවින් මූලික පාඩමක් වුවත් ඉතාමත් වැදගත් පාඩමක්. ඉංග්‍රීසි භාෂාවේ ඉතාමත් වැදගත් පද 3 ක් තමයි am, is, are කියන්නේ. මේ පද යොදා ගන්නේ කර්තෘගේ ස්වභාවය හෝ ඔහු පිළිබඳ යම්කිසි තත්ත්වයක් ප්‍රකාශ කරන්න.

ඉඳී, සිටී, තිබේ, පවතී වැනි අර්ථයන් මෙම පදවලින් ගම්‍ය වෙනවා. නමුත් මෙම පද යොදාගෙන කර්තෘ විසින් සිදුකරන කිසිඳු ක්‍රියාවක් ප්‍රකාශ වෙන්නේ නෑ. ඒ නිසා ඒවා වැටෙන්නෙ සත්‍ය ක්‍රියා ඝනයට නෙමෙයි. ඒ නිසා ඒවා හඳුන්වන්නෙ උපක්‍රියාපද නැත්නම් ආධාරක ක්‍රියාපද ලෙස,

- am - ඈම් - භාවිතාවෙන්නේ I (මම) සමඟ පමණයි.
- is - ඉස් - ඒකවචන කර්තෘවරුන් සමඟ භාවිතාවෙනවා.
- are - ආ - බහුවචන කර්තෘවරුන් සමඟ භාවිතාවෙනවා (you(ඔබ/ඔබලා))සමඟ යෙදෙන්නේ are)

eg:-

| | |
|---|---|
| This is our house | These are my books |
| දිස් ඉස් අව(ර්) හවුස් | දීස් ආ(ර්) මයි බුක්ස් |
| මේ අපේ ගේ. | මේ මගේ පොත් . |
| I am hungry | We are tired |
| අයෑම් හංග්‍රි | වී ආ ටය(ර්)ඩ් |
| මට බඩගිනියි. | අපිට මහන්සියි |
| She is beautiful | He is old now |
| ෂී ඉස් බියුටිෆුල් | හී ඉස් ඕල්ඩ් නව්. |
| ඇය ලස්සනයි. | ඔහු දැන් වයසයි |
| He is tall | She is lean |
| හී ඉස් ටෝල් | ෂී ඉස් ලීන් |
| ඔහු උසයි | ඇය කෙට්ටුයි |

It is expensive
ඉට් ඉස් එක්ස්පෙන්සිව්.
ඒක ගණන්.(මිල අධිකයි)

They are rich people.
දේ ආ රිච් පීපල්.
ඔවුන් පෝසත් මිනිස්සු.

I am 15 now
අයෑම් ෆිෆ්ටීන් නව්
මට දැන් පහලොවයි.

This tv is very old now
දිස් ටීවී ඉස් වෙරි ඕල්ඩ් නව්
මේ ටී.වී එක දැන් ගොඩක් පරණයි

We are in Kandy
වී ආ ඉන් කැන්ඩි
අපි ඉන්නේ නුවර

It is in the cupboard
ඉට් ඉස් ඉන් ද කබඩ්
ඒක කබඩ් එකේ

I am very hungry now
අයෑම් වෙරි හංග්‍රි නව්
මට දැන් හරි බඩගිනියි.

We are very tired
වි ආ වෙරි ටය(ර්)ඩ්
අපිට හරිම මහන්සියි

She is sad
ෂී ඉස් සෑඩ්
ඇයට දුකයි

He is sleepy
හී ඉස් ස්ලීපි
ඔහුට නිදිමතයි

This box is very heavy
දිස් බොක්ස් ඉස් වෙරි හෙවි
මේ පෙට්ටිය හරි බරයි.

That house is very large
දැට් හවුස් ඉස් වෙරි ලාජ්
අර ගේ හරි විශාලයි.

You are late today
යූ ආ ලේට් ටුඩේ
ඔයා අද පරක්කුයි

My grandmother is retired now
මයි ග්‍රෑන්ඩ් මද(ර්) ඉස් රිටය(ර්)ඩ් නව්
මගේ ආච්චි දැන් විශ්‍රාමිකයි

I am busy now
අයෑම් බිසී නව්
මම දැන් කාර්ය බහුලයි

We are ready
වී ආ රෙඩි
අපි ලෑස්තියි

The shop is closed
ද ෂොප් ඉස් ක්ලෝස්ඩ්
සාප්පුව වහලා

He is at home
හී ඉස් ඇට් හෝම්
ඔහු ගෙදර

ඉහත උදාහරණ සෑම එකකින්ම ප්‍රකාශ වෙන්නේ කර්තෘගේ ස්වභාවය හෝ ඔහු පිළිබඳ කිසියම් තත්ත්වයක්. මෙහිදී කතෘගේ ශාරීරික ලක්ෂණ, චරිත ලක්ෂන, කතෘ සම්බන්ධ වෙනත් ස්වභාවයන්, ද්‍රව්‍ය වල ලක්ෂ, පිහිටීම්, සිටිනා ඉන්නා තැන, ඔවැනි විවිධ කතෘ සම්බන්ධ තොරතුරු තමයි මේ පද වල ආධාරයෙන් ප්‍රකාශ වුනේ. හැබැයි මේ කිසිම වාක්‍යයකින් කිසිඳු සැබෑ ක්‍රියාවක් ප්‍රකාශ වෙන්නේ නෑ.

- am, is, are වල නැතාර්ථයේ දී සරල ලෙස not එකතු වෙනවා.

| | |
|---|---|
| I am not hungry. | He is not old. |
| අයෑම් නොට් හංග්‍රි | හී ඉස් නොට් ඕල්ඩ් |
| මට බඩගිනි නෑ. | ඔහු මහළු නෑ |

  - (නැත අර්ථයේ දී is not, are not ප්‍රායෝගික භාවිතාවේ දී බොහෝවිට isn't (ඉස්න්ට්), aren't (ආන්ට්) ලෙස කෙටිකර භාවිතා කළ හැක)

- am, is, are වල ප්‍රශ්නාර්ථයේ දී am, is are වාක්‍යයේ මුලට එනම් කර්තෘට පෙර යෙදෙනවා.

| | |
|---|---|
| Are you hungry? | Is she beautiful? |
| ආ යූ හංග්‍රි ? | ඉස් ෂී බියුටිෆුල් ? |
| ඔයාට බඩගිනිද ? | ඇය ලස්සනද? |

දැන් මෙම ප්‍රශ්නය ගනිමු.

| | | |
|---|---|---|
| Is she in the kitchen? | → | Isn't she in the kitchen? |
| ඉස් ෂී ඉන් ද කිචන් ? | | ඉස්න්ට් ෂී ඉන් ද කිචන්? |
| ඇය කුස්සියෙද ? | | ඇය කුස්සියේ නැද්ද? |

මෙය හඳුන්වන්නේ සෘන ප්‍රශ්නාර්ථය ලෙස.

| | | |
|---|---|---|
| Are you hungry ? | → | Aren't you hungry ? |
| ආ යූ හංග්‍රි ? | | ආන්ට් යූ හංග්‍රි ? |
| ඔයාට බඩගිනිද ? | | ඔයාට බඩගිනි නැද්ද ? |

am, is, are යොදාගෙන එදිනෙදා ප්‍රායෝගික ජීවිතයේ දී අපි ප්‍රකාශකරන තවත් අදහස් වලට උදාහරණ ගනිමු.

| | |
|---|---|
| You are a bit late today. | Is today a holiday ? |
| යූ ආ අ බිට් ලේට් ටුඩේ. | ඉස් ටුඩේ අ හොලිඩේ ? |
| අද ඔයා ටිකක් පරක්කුයි. | අද නිවාඩු දවසක්ද ? |

His daughter is in grade 6 now.
හිස් ඩෝට(ර්) ඉස් ඉන් ග්‍රේඩ් සික්ස් නව්
ඔහුගේ දියණිය දැන් හයේ පන්තියේ.

Buses are crowded at this time
බසස් ආ ක්‍රවුඩඩ් ඇට් දිස් ටයිම්
මේ වෙලාවට බස්වල සෙනඟ

It's very dark here.
ඉට්ස් වෙරි ඩාක් හියර්)
මෙතන හරි කළුවරයි.
(it's = It is )

It's slippery here
ඉට්ස් ස්ලිපරි හිය(ර්)
මෙතන ලිස්සනවා. (ලිස්සනසුළුයි)

It's very hot here.
ඉට්ස් වෙරි හොට් හිය(ර්).
මෙහෙ හරි රස්නෙයි.

Is your father in ?
ඉස් යුව(ර්) ෆාද(ර්) ඉන් ?
ඔයාගෙ තාත්තා ඉන්නවද( ගෙදර ඉන්නවද ) ?

You are early.
යූ ආ අ(ර්)ලි.
ඔයා වේලාසනින්

Is the train late ?
ඉස් ද ට්‍රේන් ලේට් ?
කෝච්චිය පරක්කුද ?

It's not very expensive.
ඉට්ස් නොට් වෙරි එක්ස්පෙන්සිව්
ඒක ගොඩක් ගණන් නැහැ.

This is too heavy
දිස් ඉස් ටූ හෙවි
මේක බර වැඩියි (මෙහි too යන වචනයෙන් ඉතා කියන තේරුම ලැබෙන්නෙ)

Are shops closed today?
ආ ෂොප්ස් ක්ලොස්ඩ් ටුඩේ?
අද සාප්පු වහලද?

I am broke these days
අයෑම් බ්‍රෝක් දීස් ඩේස්
මේ දවස්වල මම බංකොලොත්(අතේ සතේ නෑ)

He is not at home
හී ඉස් නොට් ඇට් හෝම්
ඔහු ගෙදර නැහැ.

Is she ill ?
ඉස් ෂී ඉල් ?
ඇය අසනිපෙන්ද ?

Is it difficult ?
ඉස් ඉට් ඩිෆිකල්ට් ?
ඒක අමාරුද ?

It is not easy
ඉට් ඉස් නොට් ඊසි
ඒක ලේසි නෑ

It is very noisy here
ඉට් ඉස් වෙරි නොයිසි හිය(ර්)
හරි සද්දයි(ශබ්දය අධිකයි)

Are you alone there ?
ආ යූ අලෝන් දෙයා ?
ඔයා ඔහේ තනියෙන්ද ?

Are you free tomorrow ?
ආ යූ ෆ්‍රී ටුමාරෝ ?
ඔයා හෙට නිදහස්ද ?(වැඩක් නැද්ද ?)

She is on leave these days
ෂී ඉස් ඔන් ලීව් දීස් ඩේස්
ඇය මේ දවස් වල නිවාඩු

He is not here
හී ඉස් නොට් හියර්(
ඔහු මෙහේ නැහැ

He is in abroad
හී ඉස් ඉන් අබ්‍රෝඩ්
ඔහු ඉන්නේ පිටරට

Your dress is crumpled
යුවර්) ඩ්‍රෙස් ඉස් ක්‍රම්පල්ඩ්
ඔයාගේ ඇඳුම පොඩි වෙලා

My shoes are worn out
මයි ෂූස් ආ වෝන් අවුට්
මගේ සපත්තු ගෙවිලා

My exams are close at hand
මයි එග්සෑම්ස් ආ ක්ලෝස් ඇට් හෑන්ඩ්
මගෙ විභාගෙ අත ලග

Your shouting is a nuisance
යුවර්) ෂවුටිං ඉස් අ නුයිසන්ස්
ඔයාගෙ කෑගැහිල්ල මහ කරදරයක්

He is a menace
හී ඉස් අ මෙනස්
ඔහු නම් මහා වදයක්

This food is stale
දිස් ෆුඩ් ඉස් ස්ටේල්
මේ කෑම නරක් වෙලා/ පිලුණු වෙලා

He is feeble now
හී ඉස් ෆීබල් නව්
ඔහු ගොඩක් දුර්වලයි

Her father is bed ridden
හර්) ෆාදර්) ඉස් බෙඩ් රිඩ්න්
ඇයගෙ තාත්තා එක් තැන් වෙලා

His English is poor
හිස් ඉංග්ලිෂ් ඉස් පුවර්)
ඔහුගෙ ඉංගීසි දුර්වලයි

The decision is pending
ද ඩිශිෂන් ඉස් පෙන්ඩිං
තීරනය ලැබීමට නියමිතයි

I am exhausted today.
අයි ඇම් එග්සෝස්ටඩ් ටුඩේ
මට අද හොඳ පන ගිහින් (exhausted - එග්සෝස්ටඩ් - දැඩි වෙහෙසට් පත් )

I am not busy today.
අයෑ ම් නොට් බිසි ටුඩේ
අද මම කාර්‍ය බහුල නැහැ නෙවේ.

I am at work now
අයෑම් ඇට් වර්)ක් නව්
මම දැන් වැඩ

She is not angry now.
ශී ඉස් නොට් ඇංග්‍රි නව්
දැන් ඇයට කේන්ති නෑ.

They are at school now.
දේ ආ ඇට් ස්කූල් නව්
ඔවුන් දැන් පාසලේ.

You are not late.
යූ ආ නොට් ලේට්
ඔයා ප්‍රමාද නෑ.

She is an innocent child
ෂී ඉස් ඇන් ඉනසන්ට් චයිල්ඩ්
ඇය අහිංසක ළමයෙක්

He is not interested in this.
හී ඉස් නොට් ඉන්ටරෙස්ටඩ් ඉන් දිස්
ඔහුට මේ ගැන කැමැත්තක්/ උනන්දුවක් නෑ.

We are not ready yet.
වී ආ නොට් රෙඩි යෙට්
අපි තවම සූදානම් නෑ.

He is busy with his phone.
හී ඉස් බිසී විත් හිස් ෆෝන්
ඔහු ෆෝන් එක එක්ක බිසී

We are in a hurry.
වී ආ ඉන් අ හරී
අපි හදිසියක ඉන්නේ

The house is very neat now
ද හවුස් ඉස් වෙරි නීට් නව්
අද ගෙදර හරි පිළිවෙලයි

Your handwriting is illegible .
යුව(ර්) හැන්ඩ්රයිටිං ඉස් ඉලෙජිබල්
ඔයාගේ අත්අකුරු කියවන්න බැහැ

It is very cold outside.
ඉට් ඉස් වෙරි කෝල්ඩ් අවුට්සයිඩ්
එළියේ හරි සීතලයි.

Dinner is almost ready.
ඩින(ර්) ඉස් ඕල්මෝස්ට් රෙඩී
රෑ කෑම තව පොඩ්ඩෙන් ලැහැස්තියි (Almost -ඕල්මෝස්ට් - (almost කියන වචනේ යෙදුනම ඒ සමග කියවෙන තත්වය ඉතාමා ආසන්න බව හැඟවෙනවා )

Your idea is excellent.
යුව(ර්) අයිඩියා ඉස් එක්සලන්ට්
ඔයාගෙ අදහස විශිෂ්ටයි (නියමයි)

Today is a rainy day
ටුඩේ ඉස් අ රේනි ඩේ
අද වැස්ස දවසක්

My phone is on silent mode.
මයි ෆෝන් ඉස් ඔන් සයිලන්ට් මෝඩ්
මගේ ෆෝන් එක සයිලන්ට් මෝඩ් එකේ

Are you free this evening ?
ආ යු ෆ්‍රී දිස් ඊව්නින් ?
ඔයා අද හැන්දෑවේ නිදහස්ද ?

Are we late for class?
ආ වී ලේට් ෆෝ ක්ලාස්?
අපි පන්තියට පරක්කුද ?

Today is a rainy day
ටුඩේ ඉස් අ රේනි ඩේ
අද වැස්ස දවසක්

My phone is on silent mode.
මයි ෆෝන් ඉස් ඔන් සයිලන්ට් මෝඩ්
මගේ ෆෝන් එක සයිලන්ට් මෝඩ් එකේ

Are you sure about this?
ආ යු ෂුව(ර්) අබවුට් දිස්?
ඔයාට මේ ගැන විශ්වාසද?

Is this expensive ?
ඉස් දිස් එක්ස්පෙන්සිව් ?
මේක ගණන්ද ?

Are buses crowded today ?
ආ බසස් ක්‍රව්ඩඩ් ටුඩේ ?
අද බස් වල සෙනගද ? (crowded – ක්‍රව්ඩඩ් - සෙනග පිරුණු , ජනාකීර්ණ )

Is he at office today?
ඉස් හී ඇට් ඔෆීස් ටුඩේ?
අද ඔහු ඔෆිස් එකේද ?

ඊලඟ පාඩමේදී මේවායේ අතීත අනාගත රූප ඉගෙන ගැනීමට අපට පුළුවන් . **එතෙක් මේ ඉගෙන ගත් සියලුම වාක්‍යය හොඳින් මතක තබා ගැනීමට උත්සාහ කරන්න**

LESSON 2

## SPOKEN ENGLISH

කලින් පාඩමේ Spoken English කොටසේදී කාට හරි greet කරන හැටි අපි ඉගෙන ගත්තා. අපිට එතැනදී ඉතාම ලස්සන දෙබස් රාශියක් හමුවුනා. එතැනදී ඔබට හොඳ අවබෝධයක් ලැබෙන්න ඇති මූලික වශයෙන් කාට හරි greet කරන විධිය ගැන

මේ කොටසෙදි අපි බලමු කාව හරි මුණ ගැහුණම greet කරන්න පුළුවන් තවත් විධි තියෙනවද කියල

- කෙනෙකුට greet කරන්න පාවිච්චි කරන්න පුළුවන් තවත් යෙදුමක් තමයි
  How are things ?- හව් ආ තිංග්ස් ?
  සිංහලෙන් වුනත් ඇතැම් විට කෙනෙකු හමුවුනාම අපි අහනවා කොහොමද ඉතින් තොරතුරු ? කියල . මෙය ආසන්න වශයෙන් එයට සමානයි

Dialogue 01

A: Hi Shan, how are things?
හායි ශාන් , හව් ආ තිංස් ?
හායි ශාන් , කොහොමද තොරතුරු ?

B: Things are good. How about you?
තිංස් ආ ගුඩ් . හව් අබවුට් යූ ?
හොදයි , ඔයාට කොහොමද ?

A: I’m well
අයෑම් වෙල්
මම හොදින්

මේ ඒ ප්‍රශ්නෙටම පිළිතුරු දිය හැකි තවත් විදියක්

Dialogue 02

A: Hi Shan, How are things ?
හායි ශාන් , හව් ආ තිංස් ?
හායි ශාන් , කොහොමද තොරතුරු ?

B: Things are great . How about you ?
තිංස් ආ ග්‍රේට් . හව් අබවුට් යූ ?
ඉතාම හොදයි . ඔයාට කොහොමද

A: I am well
අයැම් වෙල්
මම හොදින්

මේ තවත් විදියක්

Dialogue 03

A: Hi, How are things?
හායි , හව් ආ තිංස්
හායි , කොහොමද තොරතුරු ?

B: Hi, All good. How about you?
හායි , ඕල් ගුඩ් . හව් අබවුට් යූ ?
හායි, ඔක්කොම හොදයි , ඔයාට කොහොමද ?

C: Not bad .
නොට් බෑඩ්
වරදක් නැහැ

මේ අවසන් සංවාදයේ හොඳ යෙදුම් දෙකක් ආවා . එකක් All good කියන එක . දෙවැනි එක Not bad කියන එක . මේ දෙකම , How are you ? කියන පැනයට පිළිතුරු දිය හැකි තවත් විධි දෙකක්

Dialogue 04

A: Hi, How are you?
හායි , හව් ආ යූ ?
හායි , කොහොමද ?

B: Hey, All good! How about you?
හේ , ඕල් ගුඩ් ! හව් අබවුට් යූ ?
හේ , ඔක්කොම හොඳින් ! ඔයාට කොහොමද ? (Hey කියන්නේ hi වගේම හිතවත් කෙනෙකුට අමතන්න යොදා ගන්න පුළුවන් වචනයක් )

Dialogue 05

A: Hi, how are you?
හායි , හව් ආ යූ ?
හායි , කොහොමද ?

B: Hey, Not bad. How about you?
හේ නොට් බෑඩ් . හව් අබවුට් යූ ?
හේ . වරදක් නෑ . ඔයාට කොහමද ?

හොදයි , අපි තවදුරටත් බලමු අපි දන්නා අදුනන කෙනෙක් හම්බ වුනාම එයාගේ සැප සනීප ගැන විමසන්න පුළුවන් තව විධි මොනවද කියලා

- How ‘s everything ? - හව්ස් එව්රිතිං ? කොහොමද හැමදේම ?
  කව්රු හරි දන්නා කෙනෙක් හමුවුනාම එයා ගැන තොරතුරු විමසමින් කතාව පටන් ගන්න මෙය හොඳ යෙදුමක්

Dialogue 06

A: Hi, How’s everything?
හායි, හව්ස් එව්රිතිං?
හායි, කොහොමද හැම දේම ?

B: Everything is fine. How about you?
එව්රිතිං ඉස් ෆයින්. හව් අබවුට් යූ?
හැමදේම හොඳයි. ඔයාට කොහොමද?

A: I’m good too, Thanks.
අයිම් ගුඩ් ටූ, තෑන්ක්ස්.
මමත් හොඳයි, ස්තූතියි

Dialogue 07

A: Hello , How's everything ?
හෙලෝ, හව්ස් එව්රිතිං ?
හෙලෝ කොහොමද හැමදේම ?

B: Everything's good. What about you ?
එව්රිතිං'ස් ගුඩ්. වට් අබවුට් යූ ?
හැමදේම හොදයි. ඔයාට කොහොමද ?

- මේ තවත් විදියක්. How are things? "කොහොමද ඉතින් විස්තර ?" වැනි තේරුමක් එහි තිබෙන්නේ

Dialogue 08

A: How are things?
හව් ආ තිංග්ස් ?
කොහොමද තොරතුරු ?

B: Things are great. How about you?
තිංග්ස් ආ ග්‍රේට් . හව් අබවුට් යූ ?
ඉතාම හොදයි . ඔයාට කොහොමද ?

A: Not bad.
නොට් බෑඩ්
වරදක් නැහැ

- ඒ වගේම මෙහිදී යලිත් සදහන් කල යුතුයි, යමෙකුගේ දුක සැප විමසන ඉහත ප්‍රශ්න ඕනෑම එකකට උත්තර දෙන්න මේ යෙදුම් ඕනෑම එකක් සුදුසු විදියට පාවිච්චි කරන්න පුළුවන් .

  Good/ Fine/ Great/ Alright/ Not bad
  ගුඩ්/ ෆයින්/ ග්‍රේට්/ ඕල්රයිට්/ නොට්බෑඩ්

හොදයි අපි දුක සැප විමසන තවත් විදියක් බලමු .

- මෙන්න ලස්සන යෙදුමක් . How 's life - හව්ස් ලයිෆ් ? කොහොමද ජිවිතේ ? අපි දන්නා අදුනන කෙනෙක් හම්බු වුනාම සිංහලෙනුත් මේ ප්‍රශ්නය මේ විදියටම අහනවා .

Dialogue 09

A: Hello, How’s life?
හෙලෝ, හව්’ස් ලයිෆ්?
හෙලෝ, ජීවිතේ කොහොමද?

B: Pretty good. And you?
ප්‍රිටි ගුඩ්. ඇන්ඩ් යූ?
හොඳටම හොඳයි. ඔයාට ? (මෙතන pretty කියන්නේ very කියන එක )

A: I’m doing great.
අයැම් ඩූවිං ග්‍රේට්.
මම ගොඩක් හොඳින්

Dialogue 10

A : How’s life?
හවුස් ලයිෆ්?
කොහොමද ජීවිතේ?

B : Great ! How about you ?
ග්‍රේට් ! හව් අබවුට් යූ ?
නියමයි . ඔයාට කොහොමද ?

A : Not bad
නොට් බෑඩ්
වරදක් නෑ

- දුක සැප විමසන්න පුළුවන් තවත් විදියක් මේ . How‘s it going ? - කොහොමද ඉතින් (වැඩ කටයුතු කෙරීගෙන යන්නේ ) වගේ තේරුමක් එහි වචනාර්ථයෙන් හැඟවෙන්නේ

Dialogue 11

A: How’s it going?
හවුස් ඉට් ගොයිං ?
කොහොමද ඉතින් ?

B: It's going well, thanks!
ඉට්ස් ගොයිං වෙල්, තෑංක්ස්!
හොඳයි, ස්තුතියි!

It's going well - හොදට කෙරීගෙන යනවා . එය හොඳ විදියක් How's it going? කියන ප්‍රශ්නෙට උත්තර දෙන්න

Dialogue 12

A: Hi, good to see you.
හයි, ගුඩ් ටු සී යූ.
හෙලෝ, ඔයාව දැකීම සතුටක්.

B: Hi, good to see you too. So, how's it going?
හයි, ගුඩ් ටු සී යූ ටූ. සෝ, හවුස් ඉට් ගොයිං?
හෙලෝ, ඔයාවත් දැකීම සතුටක්. ඉතින් , කොහොමද?

A: Great ! How about you?
ග්‍රේට් ! හව් අබව්ට් යූ?
ගොඩක් හොඳයි ! ඔයාට කොහොමද?

B: Not bad. I've just finished my work.
නොට් බැඩ්. අයිව් ජස්ට් ෆිනිෂ්ඩ් මයි ව(ර්)ක්
වැරදක් නෑ. මම දැන් වැඩ ඉවර කලා විතරයි (just කියන යෙදුමෙන් මේ දැන් ඒ ක්‍රියාව ඉවර වුනා කියන අර්ථය එනවා )

- මේ තවත් යෙදුමක් .How's your day going? - හව්ස් යුව(ර්) ඩේ ගොයිං ? - කොහොමද ඔයාගේ දවස ?

Dialogue 13

A: How's your day going?
හවුස් යුව(ර්) ඩේ ගොයිං?
අද ඔබේ දවස කොහොමද යන්නේ ?

B: It's going fine so far.
ඉට්ස් ගොයිං ෆයින් සෝ ෆා.
මෙතෙක් හොඳයි. (so far - මේ දක්වා )

Dialogue 14

A: How’s your day going?
හවුස් යුව(ර්) ඩේ ගොයිං?
අද දවස කොහොමද?

B: Not so good. I’m feeling a little tired today.
නොට් සෝ ගුඩ්. අයිම් ෆීලිං අ ලිට්ල් ටය(ර්)ඩ් ටුඩේ.
එච්චර හොඳක් නෑ. අද මට ටිකක් මහන්සියි (මහන්සි දැනෙනවා )

- ටික කාලෙකින් දැකපු නැති කෙනෙක් හමුවුනොත් එයාගේ දුක සැප අහන්න හොඳ විදියක් මේ . How have you been ? - හව් හැව් යූ බීන් ? ඔබට කෙසේ වුනාද ? ඔබේ ජීවිතය කොහොමද ගෙව්ණේ ? වගේ අදහසක් එහි තියෙන්නේ ?

Dialogue 15

A: Hello , How have you been?
හව් හැව් යූ බීන්?
හෙලෝ, කොහොමද ඉතින් ?

B: I’ve been good. What about you?
අයිව් බීන් ගුඩ්. වට් අබවුට් යූ?
මට හොඳයි.(මම හොදින් හිටියා ) ඔයාට කොහොමද?

Dialogue 16

A: How have you been?
හව් හැව් යූ බීන්?
ඔයාට කොහොම වුනාද (පසුගිය කාලේ ) ?

B: I’ve been really busy lately. How about you?
අයිව් බීන් රියලි බිසි ලේට්ලි. හව් අබව්ට් යූ?
මේ මෑතකදී ගොඩාක්ම බිසි වෙලා හිටියේ. ඔයාට කොහොමද?

A: I am doing well.
අයෑම් ඩුයිං වෙල්.
මම හොඳින්

මෑත කාලයේ ඉංග්‍රිසි කතා කරන රටවල නිතර භාවිතා වන යෙදුමක් තමයි what 's up ?(වට්ස් අප්). එය බොහෝ විට නිතිපතා මුන ගැසෙන තම සගයෙකු දුටු විට භාවිතා කරන යෙදුමක්.. "මොනවද වෙන්නේ" වගේ තේරුමක් එහි තිබෙන්නේ . නමුත් මෙය කිසිම තොරතුරක් බලාපොරොත්තුවෙන් අසන ප්‍රශ්නයක් නෙවෙයි. අපි සිංහලෙන් දන්නා අඳුනන අයෙකු දුටුවිට නිකම්ම "ආ කොහොමද ? "කියල අසන්නාක් මෙන්.. මෙය අසන තැනැත්තා අනෙක් කෙනාගෙන් කිසිදු තොරතුරක් බලාපොරොත්තු වෙන්නේ නෑ. බෙහෝවිට මෙයට පිලිතුරු වශයෙන් ලැබෙන්නේ පහත ඒවායින් එකක්

Not much ! - නොට් මච් - එහෙමට දෙයක් නෑ

Nothing much! - නතිං මච් - වැඩි දෙයක් නෑ

Nothing special! - නතිං ස්පෙශල් - විශේෂ දෙයක් නෑ

Not bad - නොට් බෑඩ් - වරදක් නෑ වැනි පිළිතුරක්.

Dialogue 17

A: Hey ! What's up?
හේ ! වට්ස් අප්?
හේ ! මොනවද වෙන්නේ?

B: Not much. You?
නොට් මච්. යූ?
වැඩි දෙයක් නෑ . ඔයාට ?

A: Not bad.
නොට් බැඩ්
වරදක් නෑ

Dialogue 18

A: What's up?
වට්ස් අප්?
මොනවද වෙන්නේ?

B: Nothing much.
නතින් මච්.
වැඩි දෙයක් නෑ.

Dialogue 19

A: Hi ,What's up?
හායි ,වට්ස් අප්?
හායි , කොහොමද ?

B: All good!
ඕල් ගුඩ්!
ඔක්කොම හොඳයි

ඔබට ඉදිරි පාඩම්වලදී මෙවැනි දෙබස් ඛණ්ඩ රාශියක් මුණගැසේවි. ඒ හැම එකක්ම හොඳින් මතක තබාගෙන ඔබේ ඉංග්‍රිසි දැනුම සහ භාවිතය වර්ධනය කරගන්න උත්සහ කරන්න. අපි ඊළඟ කොටසින් ඉගෙන ගමු මුල් වරට හමුවුන දෙදෙනෙක් කොහොමද එකිනෙකාට greet කරන්නේ කියලා

**Vocabulary 2**

House – හවුස් – නිවස

Book – බුක් – පොත

Hungry – හංග්‍රි – බඩගිනි

Tired – ටය(ර්)ඩ් – වෙහෙසට පත්

Old – ඕල්ඩ් – පරණ , වයසක

Tall – ටෝල් – උස

Lean – ලීන් – කෙට්ටු

Expensive – එක්ස්පෙන්සිව් – මිල අධික

Rich – රිච් – ධනවත්

Poor – පුව(ර්) – දුප්පත්

People – පීපල් – මිනිස්සු

Cupboard – කබඩ් – අල්මාරිය

Sad – සැඩ් – දුකින්

Sleepy – ස්ලීපි – නිදිමත

Heavy – හෙවි – බර

Large – ලාජ් – විශාල

Box – බොක්ස් – පෙට්ටිය

Late – ලේට් – පරක්කු

Grandmother – ග්‍රෑන්ඩ්මද(ර්) – ආච්චි

Grandfather – ග්‍රෑන්ඩ්ෆාද(ර්) – සීයා

Busy – බිසී – කාර්යබහුල

Ready – රෙඩි – සූදානම්

Shop – ශොප් – කඩය

Open – ඕපන් – විවෘත

Closed – ක්ලෝස්ඩ් – වසා ඇති

kitchen – කිචන් – මුළුතැන්ගෙය

Holiday – හොලිඩේ – නිවාඩු දිනය

Daughter – ඩෝට(ර්) – දියණිය

Grade – ග්‍රේඩ් – ශ්‍රේණිය

Bus – බස් – බස් රථය

Crowd – ක්‍රවුඩ් – ජනකාය, සෙනග

Crowded – ක්‍රවුඩඩ් – සෙනඟ ඇති , ජනාකීර්ණ

Dark – ඩාක් – අඳුරු

Slippery – ස්ලිපරි – ලිස්සන සුළු

Hot – හොට් – උණු

Mother – මද(ර්) – මව

Father – ෆාද(ර්) – පියා

Early – අ(ර්)ලි – වේලාසන

Train – ට්‍රේන් – දුම්රිය

Broke – බ්‍රෝක් – මුදල් නැති

Ill – ඉල් – රෝගී

Difficult – ඩිෆිකල්ට් – අමාරු

Easy – ඊසි – ලේසි

Noisy – නොයිසි – ශබ්ද සහිත, ඝෝෂාධික

Alone – අලෝන් – තනියම

Here – හියර්) – මෙතන

There – දෙයා(ර්) – එතන

Free – ෆ්‍රී – නිදහස්

Today – ටුඩේ – අද

Tomorrow – ටුමෝරෝ – හෙට

On leave – ඔන් ලීව් – නිවාඩු ගෙන

Day – ඩේ – දවස

Date – ඩේට් – දිනය

Abroad – අබ්‍රෝඩ් – විදේශගතව, පිටරට

Dress – ඩ්‍රෙස් – ඇඳුම

Crumpled – ක්‍රම්පල්ඩ් – පොඩිවුණු

Shoe – ෂූ – සපත්තුව

Worn out – වෝන් අවුට් – ගෙවුණු , අබලන් , වැරහැලි වූ

Exam – එග්සෑම් – විභාගය

Close – ක්ලෝස් – සමීප

Far – ෆා – දුර

Shout – ෂවුට් – කෑගහනවා

Nuisance – නුයිසන්ස් – කරදරය, හිරිහැරය

Menace – මෙනස් – හිරිහැරය , මල වධය

Food – ෆුඩ් – ආහාර

Stale – ස්ටේල් – පරණ (ආහාර)

Feeble – ෆීබල් – දුර්වල

Bed ridden – බෙඩ් රිඩ්න් – ඇඳට සීමා වූ , එක්තැන් වූ

Decision – ඩිසිෂන් – තීරණය

Pending – පෙන්ඩින් – අපේක්ෂිත

Exhausted – එක්සෝස්ටඩ් – සම්පූර්ණයෙන්ම වෙහෙසට පත් , හොඳ පණ ගිය

Angry – ඇංග්‍රි – කෝපයට පත්

Work – ව(ර්)ක් – වැඩ කරණවා , වැඩ

At work – ඇට් ව(ර්)ක් – වැඩ කරන, වැඩෙහි සිටින

School – ස්කූල් – පාසල

Innocent – ඉනසන්ට් – අහිංසක

Interest – ඉන්ටරෙස්ට් – උනන්දුව

Interested – ඉන්ටරෙස්ටඩ් – උනන්දුව ඇති

Phone – ෆෝන් – දුරකථනය

Silent – සයිලන්ට් – නිශ්ශබ්ද

Mode – මෝඩ් – ආකාරය , විදිය

Morning – මෝනිං – උදෑසන

Afternoon – ආෆ්ට(ර්)නූන් – දහවල්

Evening – ඊවනිං – සවස

Hurry – හරී  – ඉක්මන් කරනවා

Neat – නීට් – පිළිවෙළට ඇති

Rain – රේන් – වහිනවා , වැස්ස

Rainy – රේනි – වැසි සහිත

Handwriting – හෑන්ඩ්රයිටිං – අත්අකුරු

Cold – කෝල්ඩ් – සීතල

Inside – ඉන්සයිඩ් – ඇතුළත

Outside – අවුට්සයිඩ් – පිටත

Sure – ෂුව(ර්) – නිසැක , සහතික , විශ්වාස

Almost – ඕල්මෝස්ට් – ඉතාම ආසන්න යන තේරුම දෙන පදයක්

Idea – අයිඩියා – අදහස

Excellent – එක්සලන්ට් – ඉතා හොඳ , විශිෂ්ට

Office – ඔෆිස් – කාර්යාලය

Thing – තිං – දෙය

Things - තිංග්ස් - දේවල්

Everything – එව්රිතිං – හැම දෙයක්ම

Life – ලයිෆ් – ජීවිතය

Great – ග්‍රේට් – විශිෂ්ට / ඉතා හොඳ

Good – ගුඩ් – හොඳ

Bad – බැඩ් – නරක

Finish – ෆිනිෂ් – අවසන් කරනවා

Lately – ලේට්ලි – මේ ලඟදී

Nothing – නතිං – කිසිවක් නැහැ

Special – ස්පෙෂල් – විශේෂ